# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 20 දරන ධීවර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූනි මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 ජූනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් ලබාගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 20 දරන ධීවර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූනි මස 16 වන දින]

එල්. ඩී.—ඕ. 44/58.

ධීවර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 20 දරන ධීවර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන ධීවර ආඥාපනතේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— 212 වන අධිකාරයේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"විෂ ආදිය පාවිච්චි කිරීමෙන් අල්ලා ගත් මාලු සන්තකයෙහි තබා ගැනීම, විකිණීම හා ප්‍රවාහනය කිරීම තහනම් කිරීම.

15. ලංකා ජලතීරයේ දී අල්ලා ගන්නා ලද්දේ වුව ද ඉන් බැහැර දී අල්ලා ගන්නා ලද්දේ වුව ද යම් විෂ ද්‍රව්‍යයක් හෝ පුපුරන හෝ මත් ද්‍රව්‍යයක් පාවිච්චි කිරීමෙන් අල්ලා ගනු ලැබූ මසුන් සන්තකයෙහි තබා ගැනීම, විකිණීම, විකිණීමට තැබීම හෝ ප්‍රවාහනය කිරීම කිසිම තැනැත්තකු විසින් නො කළ යුතු ය :

එසේ වුව ද යම් මසුන් සන්තකයෙහි තබා ගැනීම හෝ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් නඩු පවරනු ලැබූ තැනැත්තකු විසින් තමා ඒ මසුන් යම් විෂ ද්‍රව්‍යයක් හෝ යම් පුපුරන හෝ මත් ද්‍රව්‍යයක් පාවිච්චි කිරීමෙන් අල්ලා ගත් ඒවා බව නොදැන සිටි බව හෝ එසේ විශ්වාස කිරීමට සාධාරණ හේතුවක් තමාට නොතිබුණු බව ඔප්පු කිරීම ඔහුගේ නිදහසට කරුණක් විය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (11) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(11) අමාත්‍යවරයා විසින්, මසුන් ඇල්ලීම පිළිබඳ යම් ආරාවුලක් සම්බන්ධයෙන් (9) වන උපවගන්තිය යටතේ පළ කරනු ලැබූ වාර්තාව හා ඒ වාර්තාව සම්බන්ධයෙන් (10) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබූ යම් කරුණු සලකා බැලීමෙන් පසු,—

(අ) නිශ්චිත ව සඳහන් කරනු ලැබූ යම් තැනැත්තන් කණ්ඩායමකට හෝ කොටසකට අයත් නො වූ තැනැත්තන් විසින් ලංකා ජලතීරයෙහි නිශ්චිත ව සඳහන් යම් කොටසක මසුන් ඇල්ලීම තහනම් කිරීමේ, සීමා කිරීමේ හෝ විධිමත් කිරීමේ ; හෝ

(ආ) මසුන් ඇල්ලීමෙහි නියුක්ත විවිධ තැනැත්තන් කණ්ඩායම් හෝ කොටස් විසින් ලංකා ජලතීරයෙහි නිශ්චිත ව සඳහන් යම් කොටසක මසුන් ඇල්ලිය හැකි විවිධ දිනයන් හෝ වේලාවන් නියම කිරීමේ ; හෝ

කේ 21025—9,817 (73/3)

(ඈ) යම් මසුන් මැරීමේ දැලක හා ඒ මසුන් මැරීමේ දැලේ අයිතිකරුගේ ලියාපදිංචිය අවලංගු කිරීමේ හා ඒ මසුන් මැරීමේ දැල හා එහි අයිතිකරු වෙනුවට අන් කිසි මසුන් මැරීමේ දැලක් හා එහි අයිතිකරු ලියාපදිංචි කිරීමේ

කාර්යය සඳහා වූ නියෝග ඇතුළු ව ඒ ආරාවුලේ විෂය කරුණු සම්බන්ධයෙන් හෝ එයට අදාළ, එයට සම්බන්ධ හෝ එයින් උද්ගතවන යම් කරුණක් සම්බන්ධයෙන් නියෝග සෑදිය හැකි ය.".

20අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියෙහි 20අ වන වගන්තිය වශයෙන් බල පැවැත් විය යුතු ය :—

"මසුන් මැරීමේ ආරාවුල් සම්බන්ධයෙන් අතුරු නියමයන්.

20අ. (1) 20 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ විභාගයක් පවත්වා වාර්තා කිරීම සඳහා යොමු කරනු ලැබූ යම් මසුන් මැරීමේ ආරාවුලකින් සාමය කඩවීමක් සිදුවිය හැකි යයි අමාත්‍යවරයා සැක කරන අවස්ථාවක, ඒ සාමය කඩවීම වැළැක්වීම සඳහා එම වගන්තියේ (11) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් සැලකිය හැකි සියලු විධිවිධාන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සැලැස්විය හැකි ය.

(2) යම් මසුන් මැරීමේ ආරාවුලක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක් එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දිනයෙහි වලංගු විය යුතු අතර ඒ ආරාවුල සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් 20 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග ක්‍රියාත්මක වන දිනයෙහි එය වලංගුව පැවතීම අවසාන විය යුතු ය :

එසේ වුව ද ඒ නියෝග වලංගුවීමට පෙර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් ඒ නියමය ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) මේ ආඥාපනත යටතේ යම් වරදක් කර ඇති බව විශ්වාස කිරීමට 2(1) වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් නිලධරයකුට හේතු ඇත්නම් ඔහු විසින්, ඒ වරද සිදු කිරීමෙහිලා හෝ සිදු කිරීම සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් මසුන් මැරීමේ බෝට්ටුවක් හෝ, යම් මසුන් මැරීමේ දැලක් හෝ

කුරුපාවක් හෝ, අන් ආම්පන්නයක් හෝ උපකරණයක් හෝ වාහනයක් හෝ ඒ වරද සිදු කරන ලද්දේ යයි විශ්වාස කරනු ලබන්නේ යම් මසුන් සම්බන්ධයෙන් ද ඒ මසුන් හෝ තහනමට ගෙන රඳවා තබා ගැනීම කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තිය ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන්; හා

(ආ) ඒ වගන්තියේ අගට පහත සඳහන් උපවගන්තිය එකතු කිරීමෙන්:—

"(2) යම් මසුන් සම්බන්ධයෙන් 14 වන වගන්තියේ විධිවිධාන කිසිවක් කඩ කිරීම පිළිබඳව යම් නඩුවකදී පටහැනි තත්ත්වයක් ඔප්පු කරනු ලබන තෙක්, ඒ මසුන් ලංකා ජලතීරයෙහිදී අල්ලා ගත් බව පූර්ව නිග මනය කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියෙහි (2) වන හා (3) වන උපවගන්ති වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) යම් නියෝගයක හෝ 20අ වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක හෝ මේ ආඥාපනත යටතේ දෙන ලද යම් මසුන් මැරීමේ බලපත්‍රයකට හෝ අවසර පත්‍රයකට නීත්‍යනුකූලව ඇතුළු කරනු ලැබූ යම් කොන්දේසියක යම් විධිවිධාන යක් කඩකරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු වරදක් කරන අතර රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.

(3) යම් නියෝගයක හෝ 20අ වන වගන්තිය යටතේ කරන ලද යම් නියමයක යම් විධිවිධානයක් කඩකරමින් ක්‍රියා කරන තැනැත්තකු, (2) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන අන් කිසි දණ්ඩනයකට අතිරේකව, ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ කඩකිරීම ඉදිරියටත් කර ගෙන යනු ලබන එක් එක් දිනය වෙනුවෙන් රුපියල් සියයක දඩයකට ද යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (1) වන උප වගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) 14 වන වගන්තියේ හෝ 15 වන වගන්තියේ විධිවිධාන වලින් යම් විධිවිධානයක් කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එකී දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම

හෝ දෙවන වරට හෝ පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් තුන් දහසකට නො අඩු දඩයකට හෝ අවුරුදු දෙකකට නො වැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ එකී දඩය හා බන්ධනාගාර ගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (2) වන උපවගන්තිය වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(2) මහෙස්ත්‍රාත්වරයා විසින්, මේ ආඥාපනත යටතේ යම් කිසි වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කිරීමෙන් පසු, ඒ වරද සිදුකිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරන ලද යම් මසුන් මැරීමේ බෝට්ටුවක් හෝ, මසුන් මැරීමේ දැලක් හෝ කුරුපාවක් හෝ, අන් ආම්පන්නයක් හෝ උපකරණයක් හෝ යම් වාහනයක් හෝ, ඒ වරද සිදු කරන ලද්දේ යම් මසුන් සම්බන්ධයෙන්ද ඒ මසුන් හෝ ජනරජය සන්තක කළ බව ප්‍රකාශ කරමින් ආඥාවක් කළ හැකි ය:

එසේ වුවද, 14 වන වගන්තිය යටතේ හෝ 15 වන වගන්තිය යටතේ වූ වරදක් සඳහා වරදකරු කරනු ලැබීමක් සම්බන්ධයෙන් වූ විට, ඒ මසුන් මැරීමේ බෝට්ටුව, මසුන් මැරීමේ දැල හෝ කුරුපාව හෝ, අන් ආම්පන්නය හෝ උපකරණය හෝ වාහනය වරදකරු කරනු ලැබූ තැනැත්තා නොවන අන් තැනැත්තකුට අයත් බවත්, ඒ වරද සිදු කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් එය පාවිච්චි කරනු ලබන බව එහි අයිතිකරු දැන නොසිටි බවත් ඔප්පු කරනු ලැබුවහොත් මිස මහෙස්ත්‍රාත්වරයා විසින් ඉහත කී ආඥාව කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙසේ සංශෝධනය කරනු ලැබේ:—

(අ) "ලංකා ජලතීරය" යන්නේ අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"ලංකා ජලතීරය" යන්නට—

(අ) ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍ර තීරය ; හා

(ආ) පොදු බොකු, ගංගා, විල්, කලපු, පුනීල මෝය වල්, ඔයවල්, වැව්, තටාක, පොකුණු හා ඇලවල් ද අන් සියලු පොදු දේශීය ජලාශ යන් ද

ඇතුළත් වේ ; '; තවද,

(ආ) "දේශීය ජලතීරය" යන්නේ අර්ථකථනය අත්හැර ඒ වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

'"ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍ර තීරය" යන්නෙන් උචිත ආධාරක රේඛාවේ සිට මනිනු ලැබූ නෞකා සැතපුම් දොළොසක දුරප්‍රමාණය ඇතුළත මුහුදු කොටස අදහස් වේ.'.